# ජනපතිවරණවලදී අපේක්ෂකයන් වැඩි වීම වැළැක්වීමට නීති අවශ්‍යයි

## පැෆරල් සංවිධානය කියයි

ජේ.ටී. ද සිල්වා

ඡන්ද විමසීම්වලදී අනවශ්‍ය ලෙස අපේක්ෂකයන් වැඩිවීම වැළැක්වීම සඳහා නීති පද්ධතියක් ක්‍රියාත්මක කළ යුතුව ඇතැයි 2019 ජනාධිපතිවරණය පිළිබඳ පැෆරල් සංවිධානය නිකුත් කළ අතුරු වාර්තාව මඟින් අවධාරණය කර ඇත.

එම අතුරු වාර්තාව එම සංවිධානයේ විධායක අධ්‍යක්ෂ රෝහණ හෙට්ටිආරච්චි මහතා විසින් ඊයේ (26දා) ප්‍රකාශයට පත් කරමින්, ඡන්ද මධ්‍යස්ථාන තෝරාගැනීම නැවත සලකා බැලිය යුතු බවත් පූජනීය ස්ථානවල ඡන්ද මධ්‍යස්ථාන පැවැත්වීම හැකිතාක් දුරට අවම කළයුතු යැයිද පෙන්වා දුන්නේය.

පසුගිය ජනාධිපතිවරණයේදී සමාජ මාධ්‍ය ජාල, නිහඬ කාලය තුළදීත්, දේශපාලන පක්ෂ සහ අපේක්ෂකයන් ප්‍රවර්ධනය කළ බව පෙන්වාදුන් හෙට්ටිආරච්චි මහතා, සමාජ මාධ්‍ය නිදහස් අවකාශය තුළ ක්‍රියාත්මක වන බැවින්, ඒවා යම් ප්‍රමාණයකට නියාමනය කිරීම සඳහා විධිමත් නීති පැනවීම සඳහා අන්තර්ජාතිකව බලපෑම් කළයුතුව ඇතැයි එම අතුරු වාර්තාව මඟින් යෝජනා කර ඇති බව පැවැසීය.

සමාජ මාධ්‍ය සමබර කිරීම සඳහා නීති සම්මත කිරීමේ ඇති වැදගත්කමද රෝහණ හෙට්ටිආරච්චි මහතා පෙන්වා දුන්නේය.

මාධ්‍ය සමබර කිරීම සඳහා මැතිවරණ කොමිසමට බලතල ලබාදීමේදී අවශ්‍යතාවන්ද හෙතෙම අවධාරණය කළේය.

කායික දුබලතා සහිත පිරිස් සඳහාද බාධාවකින් තොරව යා හැකි ඡන්ද පොළක් නිර්මාණය කිරීම කෙරෙහිද සැලකිල්ල යොමුකරවිය යුතුව ඇතැයිද පැෆරල් සංවිධානය සිය අතුරු වාර්තාව මඟින් පෙන්වා දී ඇත.

උපතින්ම ආබාධිත අය සඳහා එක් වතාවක් පමණක් වෛද්‍ය සහතික ලබා ගැනීම පිළිබඳව සැලකිලිමත් වීමේ ඇති අවශ්‍යතාව පෙන්වාදුන් රෝහණ හෙට්ටිආරච්චි මහතා, ඡන්ද දායකයාටද වසර දහයකට එක් ලියාපදිංචි සහතිකයක් ලබාදීමේදී ඇති අවශ්‍යතාවද පෙන්වා දුන්නේය.

මැතිවරණ නිරීක්ෂණයන්, වෛද්‍යවරුන්, හෙදියන්, පෞද්ගලික ආරක්ෂක අංශ නිලධාරීන්, ප්‍රවාහන සේවා පිරිස්, පෞද්ගලික අංශයේ අත්‍යවශ්‍ය සේවාවල පිරිස්, ඡන්දය දිනයේදී විවාහ මංගල්‍යය යෙදෙන පිරිස් වැනි කණ්ඩායම් සඳහා පූර්ව ලියාපදිංචියක් මඟින් ඔවුනට ඡන්දය දිනට පෙර ඡන්දය භාවිත කිරීම සඳහා අවස්ථාව ලබාදිය යුතුව ඇතැයිද පැෆරල් සංවිධානය යෝජනා කර ඇත.

විදේශගත ඡන්දදායකයන්ට ඡන්දය භාවිත කිරීමට පහසුකම් සැලසීම සම්බන්ධයෙන් අදහස් පළකළ රෝහණ හෙට්ටිආරච්චි මහතා විදේශගත ශ්‍රමිකයන්ට ඡන්දය භාවිත කිරීමට නීතියක් හෝ ක්‍රමවේදයක් අප සතුව නොමැති බවත්, පළමු අදියර යටතේ තානාපති කාර්යාලවල සේවය කරන පිරිසයට මෙම අවස්ථාව වැඩි බාධාවකින් තොරව ලබාදිය හැකි බැවින් ඒ සඳහා අවශ්‍ය නීති සංශෝධනය වියයුතු බවද පෙන්වා දුන්නේය.

මැතිවරණ වියදම් සීමාකිරීමේ නීති කඩිනමින් සම්මත විය යුතු බව පෙන්වාදුන් හෙට්ටිආරච්චි මහතා පැමිණිලි ඒකකය විධිමත් කළයුතු බවද පෙන්වා දුන්නේය.